# පශ්චාත් යුධකාලීන ශ්‍රී ලංකාව තුළ ජාතිය ගොඩනැංවීමෙහි ලා බෞද්ධ ආගමේ බලපෑම පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

එච්.ඊ.එන්. ප්‍රියදර්ශනී[1]

ශ්‍රී ලංකාවේ දේශපාලන සන්දර්භය තුළ ජාතිය ගොඩනැංවීම ලෙස සැලකිය හැක්කේ වර්ගය, කුලය, ආගම හෝ සංස්කෘතිය අනුව බෙදී සිටින ජනවර්ග අතර පවත්නා ගැටලු නිරාකරණයකොට ඒ සියලුදෙනා සමාන අයිතිවාසිකම් ඇති, සමාන මනුෂ්‍ය ගෞරවය ඇති මිනිසුන් බවට පත්කරන වැඩපිළිවෙලක් තුළ තමන් ජීවත්වන දේශය මුල්කොට ගත් දේශාභිමානයකින් යුතුව සාමයෙන් ද එකිනෙකා කෙරෙහි ආදරයෙන් හා ගෞරවයෙන් ද ක්‍රියාකරන ශ්‍රී ලාංකීය ජාතියක් ප්‍රතිනිර්මාණය කිරීමය. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක හා ජාතික රාජ්‍යයේ පැවැත්ම සඳහා එක්සත් ජාතියක් බිහිකර ගැනීම එමෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී සාක්ෂරතාවයක් සහිත සමාජ ක්‍රමයක් නිර්මාණය කරගැනීම ශ්‍රී ලංකාවට අවශ්‍යව තිබුණ ද එම අවශ්‍යතාවයන් සපුරා ගැනීමට වර්තමානය වන විට ද නොහැකි වී ඇත. එම තත්ත්වය උදාකරගැනීමේ කර්තව්‍ය සඳහා බෞද්ධාග මට ප්‍රබල බලපෑමක් කළ හැකිව තිබුන ද එම කාර්යභාරය මැනවින් ඉටු වී නොමැත. යුද්ධය නිමා වී වසර ගණනාවක් ගතවුව ද ජාතිය ගොඩනැගීම වෙනුවට සමාජය තුළ මුල් බැසගෙන ඇත්තේ විවිධ ආගමික සංවිධානයන්හි ක්‍රියාකලාපයන්ය. බෞද්ධ ධර්මය තුළ ගැබ්ව පවත්නා සාමය, ආගමික සහජීවනය, සමානාත්මතාවය, අන්‍යයන් කෙරෙහි ගෞරව කිරීම යන සංකල්ප කෙරෙහි මූලික වශයෙන් අවධානය යොමු නොකොට බොහොමයක් වත්මන් බෞද්ධ ආගමික සංවිධානයන් ක්‍රියාත්මක වෙනු ද දැකිය හැක. මෙම තත්ත්වය තුළ ජාතිය ගොඩනැගීමේ කාර්යය අභියෝගයට ලක්ව ඇත. මෙය අධ්‍යයනය කිරීම සඳහා පශ්චාත් යුධකාලීන ශ්‍රී ලංකාව තුළ ජාතිය ගොඩනැංවීමේ ක්‍රියාවලියෙහි බෞද්ධ ආගමට සුවිශේෂී කාර්යභාරයක් කර හැකි වුවද, බෞද්ධ ආගමික සංවිධාන ජාතිවාදී මුහුණුවරක් ගෙන ක්‍රියාකරන බවට චෝදනා එල්ල වී ඇත්තේ ඇයි යන්න පර්යේෂණ ගැටලුව ලෙස සකසා මෙම පර්යේෂණය සිදුකරන ලදි. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ ලෙස ජාතිය ගොඩනැංවීම සඳහා බෞද්ධ ආගමේ කාර්යභාරය, බලපෑම අධ්‍යයනය කිරීමත් සෙසු අරමුණ ලෙසට ඇතැම් බෞද්ධ ආගම් සංවිධානයන්හි ස්වරූපය ජාතිවාදී මුහුණුවරක් ගැනීම සම්බන්ධව අධ්‍යයනය කිරීමත් ය. මේ සඳහා ප්‍රාථමික හා ද්විතීක දත්ත මූලාශ්‍ර යොදාගත් අතර අධ්‍යයනයේ සීමාවන් ලෙසට නියැඳියකට සීමාවීමට සිදුවීම, ප්‍රාථමික දත්ත මූලාශ්‍ර යටතේ ලබාගන්නා තොරතුරු පක්ෂග්‍රාහීවීම්, නිරවද්‍යතාවය යනාදි ගැටලුවලට මුහුණපෑමට සිදුවිය. මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල ලෙසට අන්‍යාග මිකකරණය, මූලධර්මවාදී ක්‍රියාකාරකම් හා ආගම් පදනම් කරගත් අන්තවාදී සංවිධාන බිහිවීම නිසා ඒවායේ ක්‍රියාකාරිත්වයේ අනිටු ප්‍රතිඵල ජාතිය ගොඩනැගීමට බාධා වන හෙයින් බෞද්ධ ආගමික නායකයින් හා සංවිධාන ඒවාට ප්‍රතිචාර දක්වන්නට යාමේදී ජාතිය ගොඩනැගීමේ කර්තව්‍යම මගහැරී ඇත. එමෙන්ම ඉස්ලාම් ආගමේ සීග්‍ර ව්‍යාප්තවාදයට විරුද්ධව බෞද්ධ ආගමික නායකයන්, සංවිධාන සෘජුව මැදිහත්වීම නිසා ක්‍රියාකාරිත්වය ජාතිවාදී මුහුණුවරක් ගැනීම මගින් ජාතිය ගොඩනැංවීමේ

1 දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ.
nilupriyadarshani120@gmail.com

ක්‍රියාකාරිත්වයට බාධා ඇතිවීමය. මෙම තත්ත්වය හේතුවෙන් ලාංකේය ජනයා තුළ තිබෙන බෞද්ධ ආගම මත පදනම් වූ සහනශීලි අදහස් යටපත්ව ගොස් අරගලකාරී අදහස් ඉස්මතුවීම නිසා පශ්චාත් යුධකාලීන ශ්‍රී ලංකාව තුළ ජාතිය ගොඩනැංවීමේ ක්‍රියාවලිය පසුගාමී වී ඇත.

ප්‍රමුඛ පද- ජාතිය ගොඩනැගීම, ජාතික රාජ්‍ය, ආගමික සහජීවනය, ප්‍රජාතන්ත්‍රවාදය